62A

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 45 යි.    තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීමේ (සංශෝධන) පනත.

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 02/91

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 5 වන වගන්තිය එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1983 අංක 12 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (4) (1) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, කම්කරුවකුට හෝ ඔහුගේ උරුමක්කාරයන්ට පාරිතෝෂිකයක් වශයෙන් අයවිය යුතු යම් මුදලක් ගෙවීමට යටත්ව සිටින්නා වූ ද එම මුදල නියමිත දිනයේ දී හෝ ඉන් පෙර ගෙවීමට අපොහොසත් වන්නා වූ ද නැතහොත් පැහැර හරින්නා වූ ද යම් සේවා යෝජකයකු පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලට අතිරේකව, එම මුදල මත පහත දැක්වෙන පරිදි ගණන් බලනු ලබන අධිභාරයක්, අවස්ථාවෝචිත පරිදි එම කම්කරුවාට හෝ ඔහුගේ උරුමක්කාරයන්ට ගෙවීමට යටත් විය යුතු ය :—

(අ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස එකකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට දහයක අධිභාරයක් ;

(ආ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස එකකට වැඩි නමුත් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට පහළොවක අධිභාරයක් ;

(ඇ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස තුනකට වැඩි නමුත් මාස හයකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) පාරිතෝෂිකය ගෙවීම නියමිත දිනයේ සිට මාස හයකට වැඩි නමුත් මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට විසිපහක අධිභාරයක් ;

2—ඩී 021998—5,380 (92/04)

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

(ඉ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස දොළහකට වැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට තිහක අධිභාරයක්.

මේ වගන්තියේ කාර්ය සඳහා, පාරිතෝෂිකයක් සම්බන්ධයෙන්, "නියමිත දිනය" යන්නෙන්, පාරිතෝෂිකය ගෙවනු ලැබිය යුතු කම්කරුවාගේ සේවාවන් අවසන් කරනු ලැබූ දින සිට තිස්වන දිනය අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'(8) මේ වගන්තියේ කාර්ය සඳහා "පාරිතෝෂිකය" යන්නට, 5 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් අධිභාරයක් ඇතුළත් වේ.'.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.